**ශීර්ෂය:- 322 ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 මැයි 24 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරියාගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 **මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදිම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5** **වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

#### (අ) පුනරාවර්තන වියදම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණකාධිකාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල වැඩසටහන් අනුව වියදම් සාරාංශය ACA -2 (ii) ආකෘතියේ අනෙකුත් භාණ්ඩ හා සේවා යටතේ වර්ගීකරණය කර තිබුණු වැය විෂය 1101 දේශීය ගමන් වියදම් රු.2,086,572 ක් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයෙහි වැටුප් හා වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ යටතේ දක්වා තිබුණි. | මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය නිවැරදි කළ බව දන්වා ඇත. | වියදම් නිවැරදි වර්ගීකරණයන් යටතේ දැක්විය යුතුය. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ එකතුව රු. 346,500 ක මූලධන වියදම් විෂයන් 3 ක්, වැය විෂය 1201 ලිපි ද්‍රව්‍ය හා කාර්යාල අවශ්‍යතා යටතේ ගිණුම්ගත කර තිබුණි. | දෙපාර්තමේන්තුවේ වත්කම් ගිණුම නිවැරදි කිරීමේදී මෙම වත්කම් ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. | මූලධන වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (iii) | යටිතල පහසුකම් සංවර්ධන වැය විෂය 322-2-1-11-2506 යටතේ එකතුව රු. 2,386,677 ක පුනරාවර්තන වියදම් 38 ක් දක්වා තිබුණි. | මෙම පුනරාවර්තන වියදම් ප්‍රාග්ධන වැය විෂය යටතේ දරා ඇති බව දන්වා ඇත. | පුනරාවර්තන වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |

#### (ආ) මූලධන වියදම්

| විගණන නිරීක්ෂණය | ගණකාධිකාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 322-2-1-11-2506 යටිතල පහසුකම් සංවර්ධන වැය විෂය යටතේ එකතුව රු.22,874,052 ක මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීමේ වියදම් හා මූලධන වත්කම් අත්පත් කර ගැනීමේ වියදම් විෂයන් 19 ක් දක්වා තිබුණි. | යටිතල පහසුකම් සංවර්ධන කටයුතු සඳහා අවශ්‍ය මූලධන වියදම් මෙම වැය විස්තරයෙන් දරන ලද බව දන්වා ඇත. | වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |

**(ඇ) මූල්‍ය නොවන වත්කම්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේ ජනවාරි 1 දිනට මූල්‍ය නොවන වත්කම් දේපළ පිරියත හා උපකරණ ශේෂය රු.7,618,013,766 ක් ලෙසට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයෙහි දක්වා තිබුණ ද, ඊට අදාළ භාණ්ඩාගාර මුද්‍රිත මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශ SA82 ආකෘතිය අනුව එදිනට එම ශේෂය රු.7,585,753,454 ක් වූයෙන් රු.32,260,312 ක වෙනසක් පැවතුණි. | තවදුරටත් නිවැරදි කළ යුතු ශේෂ 2022 වර්ෂයේදී නිවැරදි කර වාර්තා කරන බව දන්වා ඇත. | භාණ්ඩාගාර පොත් සමග සසදා නිවැරදිව ගිණුම් පවත්වාගෙන යා යුතුය. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ භාණ්ඩාගාර මුද්‍රිත මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශ SA82 ආකෘතිය අනුව 2021 වර්ෂය තුළ මූල්‍ය නොවන වත්කම් අත්පත් කර ගැනීම් රු.91,231,407 ක් වුවද, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය අනුව මූලධන වත්කම් අත්පත් කර ගැනීම් රු.91,767,957 ක් වූයෙන් රු.536,550 ක වෙනසක් පැවතුණි. | මේ සම්බන්ධයෙන් පරීක්ෂා කර නැවත ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. | භාණ්ඩාගාර පොත් සමග සසදා නිවැරදිව ගිණුම් පවත්වාගෙන යා යුතුය. |
| (iii) | සමාලෝචිත වර්ෂය තුළ වත්කම් විකිණීමක්, අගය අඩු කිරීමක් හෝ අපහරණය කිරීමක් සිදුකර නොතිබුණ ද, භාණ්ඩාගාර මුද්‍රිත මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ SA82 ආකෘතියේ ගොඩනැගිලි හා ඉදිකිරීම්, වාහන හා යන්ත්‍රෝපකරණ සහ උපකරණවල අගයෙන් රු.29,767,326 ක මූල්‍ය නොවන වත්කම් ඉවත් කිරීම් දක්වා තිබුණි. | මේ පිළිබදව පරීක්ෂා කර බලා විගණනය වෙත වාර්තා කරන බව දන්වා ඇත. | වත්කම් ඉවත් කිරීම් නිවැරදිව හදුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (iv) | දෙපාර්තමේන්තුවේ වැය විෂය 2105, ඉඩම් හා ඉඩම් සංවර්ධන වියදම් යටතේ වැටුප්, දුරකතන, අළුත්වැඩියා කිරීමේ, අතිකාල දීමනා ගෙවීම්, විදුලි බිල්පත් ගෙවීම්, ඉන්ධන, ජල බිල්පත්, ගමන් වියදම් එකතුව රු. 67,943,891 ක් දක්වා තිබුණි. | ඉදිරියේදී ඉඩම් හා ඉඩම් සංවර්ධනය යටතේ පුනරාවර්ථන වියදම් ඇස්තමේන්තු නොකර වාර්ෂික ඇස්තමේන්තු සකස් කිරීමට අදාල නිළධාරීන් දැනුවත් කළ බවදන්වා ඇත. | වියදම් නිවැරදිව හදුනාගෙන නිවැරදි වැය විෂයන් යටතේ ගිණුම් ගත කළ යුතුය. |
| (v) | සමාලෝචිත වර්ෂයේ 2101, 2102, 2103 සහ 2104 ප්‍රාග්ධන වැය විෂයයන් 04 යටතේ මූලධන වත්කම් අත්පත් කර ගැනීම සඳහා රු.23,582,498 ක් වැය කර තිබුණ ද, දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරන ලද භාණ්ඩාගාර මුද්‍රිත මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ SA82 ආකෘතියේ ස්ථාවර වත්කම් නිවැරදිව වර්ගීකරණය කර දක්වා නොතිබුණි. | වත්කම් විෂයන් නිවැරදිව වර්ගීකරණය කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. | වත්කම් අත්පත් කර ගැනීම් නිවැරදිව හදුනාගෙන ගිණුම්ගත කළයුතුය. |

| | | | |
|---|---|---|---|
| (vi) | උද්භිද උද්‍යාන භාර අරමුදලේ වත්කම් ලෙස 2010 වර්ෂයේ සිට හඳුනාගෙන තිබුණු රු.789,631,963 ක වත්කම් වලින්, රු.305,587,837 ක ගොඩනැගිලි අලුත්වැඩියා කිරීම් හා ඉඩම් සංවර්ධන වැඩ සහ රු.843,297 ක පුස්තකාල පොත් ගිණුම්ගත කර නොතිබුණි. | 2022 වර්ෂයේ වත්කම් ගිණුමට ඇතුලත් කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. | දෙපාර්තමේන්තුව සතු සියලු වත්කම් නිවැරදිව හඳුනාගෙන ගිණුම් ගත කළ යුතුය. |

**(ඈ) මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

-----------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂය සඳහා වූ අත්තිකාරම් අය කර ගැනීම් රු.29,382,244 ක් වුවද එය රු.24,656,611 ක් ලෙස රු. 4,725,633 ක් මුදල් ගලාඒම් අඩුවෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් යටතේ දක්වා තිබූ අතර අත්තිකාරම් ගෙවීම් රු. 30,451,860 ක් වුවද එය රු.28,122,342 ක් ලෙස රු.2,329,518 මුදල් ගලායාම් අඩුවෙන් මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් යටතේ දක්වා තිබුණි. | අත්තිකාරම් අයකර ගැනීම් සහ ගෙවීම් රු. 24,656,611 ක් සහ රු.30,451,861 ක් ලෙස දක්වා ඇත්තේ අනෙකුත් දෙපාර්තමේන්තු වෙත හරස් සටහනින් පියවන ලද අත්තිකාරම් හැර මෙම දෙපාර්තමේන්තුව විසින් අයකරගත් සහ ගෙවන ලද අත්තිකාරම් පමණි. | අත්තිකාරම් අයකර ගැනීම් හා ගෙවීම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්වලට අදාළව මුදල් ගලා යාම රු.568,602,369 ක් වුවද එය රු.507,950,626 ක් ලෙස රු.60,651,743 ක් මුදල් ගලායාම් අඩුවෙන් මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් යටතේ දක්වා තිබුණි. | පුනරාවර්ථන වියදම් යටතේ දක්වා ඇත්තේ භාණ්ඩාගාර ආකෘති අනුව ACA-2(II) න් හඳුනා ගත් වියදම් පමණි | මෙහෙයුම් ක්‍රියාකාරකම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (iii) | සහනාධාර හා මාරු කිරීම්වලට අදාළව මුදල් ගලා යාම රු.80,095,987 ක් වුවද එය රු.1,476,034 ක් ලෙස මුදල් ගලායාම් රු.78,619,953 ක් අඩුවෙන් දක්වා තිබුණි. | සහනාධාර හා මාරුකිරීම් වලට අදාලව මුදල් ගලා යාම ලෙස රු. 1,476,034ක් ලෙස දක්වා ඇත්තේ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය අනුව පුනරාවර්තන වියදම් යටතේ භාණ්ඩාගාර ආකෘති අනුව ACA-2(II) න් හඳුනා ගත් වියදම් පමණි. | සහනාධාර හා මාරු කිරීම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (iv) | සමාලෝචිත වර්ෂයේ වෙනත් වැය විෂයයන් වෙනුවෙන් දරන ලද වියදම රු.18,564,455 ක් වුවද එය රු.16,168,340 ක් ලෙස මුදල් ගලායාම් රු.2,396,115 ක් අඩුවෙන් මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වු මුදල් ප්‍රවාහයන් යටතේ දක්වා තිබුණි. | රු. 2,396,115 ක් අඩුවෙන් දක්වා ඇත්තේ විශ්‍රාම ගිය නිළධාරීන්ගේ ණය ශේෂ අයකර ගැනීම සඳහා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ වැය ශීර්ෂය හර කර දෙපාර්තමේන්තුවේ අත්තිකාරම් ගිණුම බැර කරන ලද හරස් සටහන් මගින් ගිණුම් ගත කරන ලද මුදල වේ. | වෙනත් වැය විෂයයන් වෙනුවෙන් දරන ලද වියදම නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (v) | සමාලෝචිත වර්ෂයේ භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්පත් කර ගැනීම රු. 91,767,956 ක් වුවද රු. 231,039,652 ක් ලෙස ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වු මුදල් ප්‍රවාහ යටතේ දක්වා තිබීම හේතුවෙන් මුදල් ගලායාම් රු.139,271,696 ක් වැඩියෙන් දක්වා තිබුණි. | ආයෝජන අත්පත් කර ගැනීම් වලට අදාලව මුදල් ගලා යාම රු. 231,039,652 ක් දක්වා ඇත්තේ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය අනුව මූලධන වියදම් යටතේ භාණ්ඩාගාර ආකෘති අනුව ACA-2(II) න් හඳුනා ගත් වියදම් වේ. | ආයෝජන ක්‍රියාකාරකම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

--------------------

### 2.1 වියදම් කළමනාකරණය

--------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දී පුනරාවර්තන හා මූලධන වියදම සඳහා රු.1,115,680,000 ක ශුද්ධ ප්‍රතිපාදනයක් සලසා තිබුණ ද, ඉන් රු.375,172,598 ක් ඉතිරි වී තිබුණි. එය සමස්ත ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 34 ක් විය. තවද ඉතිරිවීම්වලින් සියයට 92 ක් ප්‍රාග්ධන ඉතිරිවීම් වන අතර එය ශුද්ධ ප්‍රාග්ධන ප්‍රතිපාදනයෙන් සියයට 60 ක් එනම් රු.344,440,348 ක් විය. | ප්‍රාග්ධන හා පුනරාවර්ථන ශුද්ධ ප්‍රතිපාදනය රුපියල් 1,115,680,000 ක් හා ඉතිරිය රු. 375,172,598 ක් බව පිළිගනිමි. | ප්‍රතිපාදන කාර්යක්ෂමව හා ඵලදායීව උපයෝජනය කළ යුතුය. |
| (ආ) | පුනරාවර්තන හා මූලධන වැය විෂයයන් 28 ක ශුද්ධ ප්‍රතිපාදනය වූ රු. 644,330,000 න් රු.355,882,937 ක් හෙවත් සියයට 55 ක් ඉතිරි වී තිබුණි. එම ඉතිරිය එක් එක් වැයවිෂයන්ගේ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 10 ත් සියයට 100 ත් අතර පරාසයක විය. | වැය විෂයන් 28 ක ප්‍රතිපාදන ඉතිරිවී ඇති බව පිළිගනිමි. | අවශ්‍යතාවය නිසිපරිදි හඳුනා ගෙන පූර්ව සැලසුම් සකස් කළයුතු අතර හා මනා කළමනාකරණයකින් යුක්තව වියදම් කළ යුතුය. |

## 2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නිරීක්ෂණය නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම රු. | අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රාජ්‍ය සේවා කොමිසම් සභාවේ කාර්ය පරිපාටික රීති 193 | | පේරාදෙණිය මල්වගා පර්යේෂණ හා සංවර්ධන අංශය, හක්ගල සහ ගම්පහ උද්භිද උද්‍යානවල සේවකයින් 31 දෙනෙකු වසර 5 සිට වසර 23 අතර කාලයක් එකම සේවා ස්ථානයේ සේවය කර තිබුණි. | ගාස්තු අයකිරීමේ සහකාරවරු ඉදිරියේදී ස්ථානමාරු කිරීම සිදු කරන බවත් අනෙකුත් සේවකයින් උද්‍යානය අවට පදිංචිව සිටීමත් අර්ථික අපහසුතා මත ස්ථානමාරු සිදු කර නොමැති බව දන්වා ඇත. | කාර්යය පරිපාටික රීති අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | 2011 පෙබරවාරි 10 දිනැති ආපදා කළමනාකරණ අමාතාංශයේ අංක 2011/1 දරන චක්‍රලේඛය | | නුවරඑළිය දිස්ත්‍රික්කය තුළ කවර හෝ ඉදිකිරීම් කාර්යයක් ආරම්භ කිරීමට පෙර ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයෙන් යෝග්‍යතා සහතිකයක්/ නිර්දේශයක් ලබා ගැනීම අනිවාර්ය වුවද හක්ගල උද්භිද උද්‍යානයේ යෝජිත කැෆටේරියා ආපනශාලාව ඉදකිරීමට අදාළව එසේ සහතිකයක් හෝ නිර්දේශයක් 2021 නොවැම්බර් 30 දින වන විට ද ලබාගෙන නොතිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | අදාල යෝග්‍යතා සහතිකයක්/ නිර්දේශයක් ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 2.3 තැන්පත් ශේෂයන්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් රෙගුලාසි 570 හා 571 ප්‍රකාරව තැන්පත් කළ දින සිට වසර 02 ඉක්මවූ සියලු තැන්පත් රාජ්‍ය ආදායමට බැරකළ යුතු වුවද, රු. 10,639,463 ක තැන්පතු 113 ක් සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි. | 2022 වර්ෂයේ මෙම අඩුපාඩු මගහරවා ගෙන කටයුතු කිරීමට සටහන් කර ගත් බව දන්වා ඇත. | මුදල් රෙගුලාසි විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

---

### 3.1 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගම්පහ උද්භිද උද්‍යානයේ වැසිකිළි පද්ධතියක් සහ ගබඩා ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා වූ කොන්ත්‍රාත්තුවක් 2021 අප්‍රේල් 12 දින එකතුකළ අගය මත (වැට්) බදු රහිත රු. 5,969,866 මුදලකට 2021 ඔක්තෝබර් 12 දිනට පෙර නිම කිරීම සඳහා පිරිනමා තිබුණි. ඊට අදාල විදුලි උපාංග, ජල උපාංග සහ සනීපාරක්ෂක උපාංග සවිකිරීම, පිහන් ගඩොල් ඇතිරීම, දොරවල් සවි කිරීම යන කාර්යයන්, 2022 ජනවාරි 12 දින වන විටද නිමකර නොතිබුණි. | ගොඩනැගිල්ල ටයිල් කිරීම සඳහා කොන්ත්‍රාත්කරු විසින් අවශ්‍ය ටයිල් ලබාගැනීම අත්තිකාරමක් ගෙවා ඇති අතර ටයිල් කිරීමේ වැඩකටයුතු නිම කරන තෙක් විදුලි උපාංග සවිකිරීම, ජල උපාංග, සනීපාරක්ෂක උපාංග, දොරවල් සවිකිරීමට නොහැකි බව දන්වා ඇත. | අදාළ ඉදිකිරීම් කටයුතු නියමිත කාලය තුළ නිම කරවා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය සඳහා වූ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ ඇතුලත් මල් වගා පර්යේෂණ හා සංවර්ධන අංශයේ චේන් ලින්ක් වැටෙහි තීන්ත ආලේප කිරීම, ජලජ ශාක එකතුව වැඩිදියුණු කිරීම සහ ඇන්තූරියම් කොටස වැඩිදියුණු කිරීම යන ක්‍රියාකාරකම් 03 සඳහා රු.2,370,000 ක ප්‍රතිපාදන සලසා තිබුණද එම කාර්යයන් 2021 දෙසැම්බර් 31 දින වන විටද ආරම්භ කර නොතිබුණි. | Covid 19 වසංගත තත්ත්වය මත කොන්ත්‍රාත්කරු චේන් ලින්ක් වැටෙහි තීන්ත ආලේප කිරීම සහ ජලජ ශාක එකතුව වැඩිදියුණු කිරීම ආරම්භ නොකරන ලදී. ඇන්තූරියම් කොටස වැඩිදියුණු කිරීම උද්‍යාන නව සැලසුම් නිසා ඉටු කිරීමට නොහැකි වූ බව දන්වා ඇත. | අදාළ ඉදිකිරීම් කටයුතු නියමිත කාලය තුළ නිම කරවා ගත යුතුය. |

### 3.2 වාර්ෂික කාර්යසාධන වාර්තාව

---

2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍ර ලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන කළ මාර්ගෝපදේශ අංක 14 හි සඳහන් ආකෘතිය ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තාව පිළියෙල කළ යුතුව තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයට අදාළ කෙටුම්පත් කාර්යසාධන වාර්තාවෙහි ඉලක්ක යටතේ මල් වගා හා උද්‍යාන අලංකරණ ජාතික ඩිප්ලෝමාව NVQ – 5 සහ NVQ 6 මට්ටම ආරම්භ කිරීම හා වෘත්තීය නිපුණතා සහතික නිකුත් කිරීම දක්වා තිබුණි. එහෙත් එම ඉලක්ක සපුරා ගැනීම සඳහා අදාළ කටයුතු වල කාර්යසාධනය අවම මට්ටමක පැවතුණි. | නවක නිලධාරීන් බඳවා ගැනීමේදී මේ සම්බන්ධයෙන් කටයුතු කිරීමට සැලසුම් කරන බව දන්වා ඇත. | කාර්යසාධන වාර්තාවේ ඉලක්ක ලගාකර ගැනීමට අදාලව කටයුතු සැලසුම් කළ යුතු බව. |

**3.3 ප්‍රසම්පාදනයන්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 (ආ) අනුව රු. 500,000 ඉක්මවන භාණ්ඩ හෝ සේවා සඳහා විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමකට එළැඹීමට කටයුතු කළ යුතු වුවද ජාතික ශාකාගාරය, මල්වගා පර්යේෂණ ආයතනය සහ හක්ගල උද්භිද උද්‍යානය විසින් අවස්ථා 9 කදී රු.22,023,990 ක වූ භාණ්ඩ හා සේවා මිලදී ගැනීම්වලට අදාළව ගිවිසුමකට එළඹ නොතිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව ගිවිසුම්වලට එළඹීමට කටයුතු කරන බව දන්වා ඇත. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ නියමයන් අනුව කටයුතු කළ යුතු වීම. |
| (ආ) | කොන්ත්‍රාත් සඳහා ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී Provisional sum (PS) විෂයන් ඇතුළත් කරනු ලබන්නේ කොන්ත්‍රාත්තුවක් තුල පිරිවැය තීරණය කිරීම සඳහා ප්‍රමාණවත් ලෙස හඳුනා ගත නොහැකි, සැළසුම් කළ නොහැකි, ප්‍රමාණවත් විස්තරයක් ලබා ගත නොහැකි විෂයන් සඳහා වේ. එහෙත් උද්‍යාන භාරකරු බංගලාව (Curator's Bangalow) අළුත්වැඩියා කිරීම සහ ගම්පහ උද්භිද උද්‍යානයේ පැළ විකුණුම් අලෙවි සැල ඉදි කිරීම යන කොන්ත්‍රාත්තු සඳහා පිළියෙල කර තිබූ ප්‍රමාණ පත්‍රවල රු. 1,325,000 ක අගයක් Provisional sum (PS) ලෙස පැන්ට්‍රි කබඩ් තැනීම, පිහන් ගඩොල් ඇතිරීම හා පොලිකාබනේට් සෙවිලි තහඩු සවිකිරීම යනාදිය සඳහා ඇතුළත් කර තිබුණි. | වෙළඳපොලේ පවතින භාණ්ඩ සඳහා ආනයන සීමා පැනවීම හා ඇමරිකානු ඩොලරයට සාපේක්ෂව රුපියලේ අගය පහත වැටීම හේතුවෙන් පැවති මිල ගණන් නිරතුරුවම වෙනස් වීම සහ මිල ගණන් වෙළඳපොලේ සොයාගනීමට නොහැකි වූ බැවින් Provisional sum (PS) ඇතුළත් කළ බව දන්වා ඇත. | අදාළ වැඩය හෝ කොන්ත්‍රාත්තුවේ එක් එක් විෂයන්ට අදාළව හැකි සෑම අවස්ථාවකම ප්‍රමාණ පත්‍ර පිළියෙල කිරීමට කටයුතු කළ යුතුය. |

**3.4 රජයේ නිලධාරීන් ඇප තැබීම**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | මුදල් රෙගුලාසි 880 ප්‍රකාරව රජයේ මුදල්, ආදායම්, මුද්දර හෝ බඩු බාහිරාදිය භාර ගැනීම හෝ භාරව සිටීම එසේ නැතහොත් මුදල් සම්බන්ධව පරිපාලනමය වශයෙන් වග කිව යුතු හෝ බලය පැවරීම යටතේ එම කටයුතු පවරනු ලැබ ඇති හෝ නිලධාරීන්ද 612 අධිකාරිය යටතේ රජයේ නිලධාරීන්ගේ ඇප ආඥා පනතට අනුව ඇප තැබිය යුතු වුවත් ජාතික ශාකාගාරයේ හා හක්ගල උද්භිද උද්‍යානයේ මුදල් සහ භාණ්ඩ කටයුතු සම්බන්ධව වගකීම් දරන නිලධාරීන් 06 දෙනෙකුගෙන් අදාළ ඇප මුදල් අය කර නොතිබුණි. | ඇප මුදල් අයවිය යුතු සියලුම නිලධාරීන්ගෙන් ඇප අය කිරීමට කටයුතු කර ඇති බව දන්වා ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව අවශ්‍ය කටයුතු සිදු කළ යුතුය. |

**3.5 පාඩු හා හානි**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගම්පහ උද්භිද උද්‍යානයේ උද්‍යාන තවාන් අංශයේ ඇති පැළ සම්බන්ධයෙන් සිදුකරන ලද නියැදි පරීක්ෂාවේ දී භෞතිකව පැවති පැළ සංඛ්‍යාව සහ පොත්වල සඳහන් පැළ ශේෂ අතර පැළ වර්ග 7 කට අදාළව රු.203,460 ක වටිනා පැළ 4921 ක ඌනතාවයක් පැවතුනි. | මෙය පැල වල ඌනතාවයක් නොවන බවත් පොත්පත් නිවැරදිව යාවත්කාලීන නොවීම මත ඇතිවූ ඌනතාවයක් බව දන්වා ඇත. | ලේඛන විධිමත්ව නඩත්තු කිරීමට කටයුතු කළ යුතු අතර ඌනතාවයන් සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් සිදු කළ යුතුය. |
| (ආ) | ගම්පහ උද්භිද උද්‍යානයේ වැසිකිලි පද්ධතියක් සහ ගබඩා ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් අවම මිල ගණන් ඉදිරිපත් කර තිබුණු ආයතනය වෙත එකතුකළ අගය මත බදු රහිත රු.5,544,956 ක මුදලකට ලබාදීම සුදුසු බව නිර්දේශ කර තිබුණද , ප්‍රසම්පාදන කමිටුව විසින් එය නොසලකා කොන්ත්‍රාත්තුව දෙවන අවම ලංසුකරුට වැට් බදු රහිතව රු.5,969,866 කට ප්‍රදානය කිරීම මත රජයට රු.424,910 ක අලාභයක් සිදුව පැවතුණි. | මෙම ලංසුව විවෘත කර ඇත්තේ 2020 පෙබරවාරි 2 දින වන බැවින් 2020 නොවැම්බර් 9 දිනැති 4/2020 චක්‍රලේඛය පාදක කර ගත් බව දන්වා ඇත. | ලංසු ඇගැයීම අවම පිරිවැයක් දැරීමේ ප්‍රතිඵලයක් ලෙස උපරිම ආර්ථික වාසි සැලසෙන පරිදි සිදු කළ යුතුය. |

## 3.6 කළමනාකරණ දූර්වලතා

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4 වගන්තිය අනුව විශ්‍රාම ගිය, මියගිය හා වැඩ තහනම් කළ නිලධාරීන්ගේ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළයුතු වුවද, නිලධාරීන් 27 දෙනෙකුගෙන් අය විය යුතු එකතුව රු.3,758,347 ක් වූ ණය ශේෂ පියවාගෙන නොතිබුණි. | විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා කැබිනට් පත්‍රිකාවක් අනුමැතියට ඉදිරිපත් කර ඇත. ඒ සම්බන්ධයෙන් කටයුතු අවසන් වූ වහාම ණය ශේෂය පියවීමට කටයුතු කරනු ලබන බව දන්වා ඇත. | ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව හිඟ ණය මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 4. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| උද්‍යානයේ කටයුතු විධිමත්ව හා ක්‍රමවත්ව පවත්වාගෙන යාමට සේවක අවශ්‍යතා සුදුසු අවස්ථාවේදී හඳුනා ගනිමින් අවශ්‍ය අවස්ථාවේ බඳවා ගැනීම් සිදු කළ යුතු වුවද සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 162 ක් පැවතුණි. | අදහස් දක්වා නොමැත | පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය. |